11/1264/558/028


ෆැක්ස් අංකය
தொலைநகல்
Fax No. 2323730

ඊ-මේල්
மின்னஞ்சல்
E-mail cabsecsl@sltnet.lk

වෙබ් අඩවිය
வெப் தளம்
Web Site www.CabinetOffice.gov.lk


# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# அமைச்சரவை அலுவலகம்
# OFFICE OF THE CABINET OF MINISTERS


ජනරජ චතුරශ්‍රය, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.
குடியரசுச் சதுக்கம், சேர் பாரோன் ஜயதிலக்க மாவத்தை, கொழும்பு 01.
Republic Square, Sir Baron Jayathilaka Mawatha, Colombo 01.


මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

## අමාත්‍ය මණ්ඩල සටහන

### අන්තර්කාලීන විධිවිධානයක් වශයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යයන් <u>අමාත්‍ය මණ්ඩලය විසින් ඉටු කිරීම</u>

එවකට පැවති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ ජාතික පොලිස් කොමිෂන් සභාවේ නිල කාලය අවසන්වීමෙන් පසු එම කොමිෂන් සභා දෙක විසින් ඉටු කරන ලද කාර්යයන් එම කොමිෂන් සභා පිහිටුවන තෙක් අමාත්‍ය මණ්ඩලය විසින් ඉටු කළයුතු බවට, 2009 මැයි මස 06 දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී කරන ලද තීරණය පරිදි, හුදෙක් තාවකාලිකව ගනු ලබන අතුරු පියවරක් වශයෙන් එකී කොමිෂන් සභා මගින් ඉටු කරවා ගතයුතුව තිබුනු කාර්යයන් අමාත්‍ය මණ්ඩලය වෙත යොමුකළ හැකි බවට තීරණය කරන ලදී. මෙම තීරණය ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍යාංශ විසින් කටයුතු කළයුතු ආකාරය දැක්වෙන මාර්ගෝපදේශ 2009.06.25 දිනද, සංශෝධිත මාර්ගෝපදේශ 2009.11.11 දිනද, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව අමාත්‍ය මණ්ඩලයේ ලේකම් විසින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත නිකුත් කරන ලදී.

02. **මේ අනුව දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 55(1) ව්‍යවස්ථාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එතෙක් ඉටු කරන ලද රාජ්‍ය නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, ස්ථානමාරු කිරීම, විනය පාලනය, සේවයෙන් පහ කිරීම සම්බන්ධ කටයුතු ද, මෙම කාලය තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ඉටු කරන ලදී. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය 2010.09.09 දින සම්මත වීමෙන් පසුවද සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව 2011.05.13 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වන තුරු ද මෙකී වැඩපිළිවෙල ක්‍රියාත්මක විය.** අමාත්‍ය මණ්ඩලය විසින් මෙම කාර්යයන් ඉටු කරනු ලැබුවේ අමාත්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළයුතු දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 55(3) ව්‍යවස්ථාව යටතේ වන සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන් පිළිබඳ කටයුතු ද, 55(4) ව්‍යවස්ථාව යටතේ වන රජයේ නිලධරයන් හා සම්බන්ධ සියලු ප්‍රතිපත්තිමය කාරණා සඳහා විධිවිධාන සැලසීම හා ඒ කාරණා තීරණය කිරීම ද යන කරුණුවලට අතිරේකවය.

cabinet memoranda


ලේකම්
செயலாளர்
Secretary 2329620

අතිරේක ලේකම්
மேலதிகச் செயலாளர்
Additional Secretary 2325279

ප්‍රධාන ලිපිකරු
பிரதம இலிகிதர்
Chief Clerk 2422438

03. ඉහත 2 ඡේදයේ සඳහන් කාර්යයන් ඉටු කිරීමේදී අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම, 2007.02.07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලැබ තිබූ (එවකට ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය) ගරු සරත් අමුණුගම අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් සහ තවත් ගරු අමාත්‍යවරුන් 04 දෙනෙකුගෙන් සමන්විත ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත පැවරුණි. 2010.05.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව මගේ සභාපතිත්වයෙන් සහ තවත් ගරු අමාත්‍යතුමන්ලා 08 දෙනෙකුගන් සමන්විතව ක්‍රියාත්මක විය. 2010.11.22 දින සිට උක්ත අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව යහ පාලනය හා යටිතල පහසුකම් පිළිබඳ (ජ්‍යෙෂ්ඨ) අමාත්‍ය ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමාගේ සභාපතිත්වයෙන් සහ තවත් ගරු ජ්‍යෙෂ්ඨ අමාත්‍යතුමන්ලා දෙදෙනෙකු සහ ගරු අමාත්‍යතුමන්ලා අටදෙනෙකුගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක වේ.

04. ගරු අමාත්‍යවරුන් විසින් ඉදිරිපත් කෙරෙන යෝජනා පිළිබඳව උක්ත අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට අදහස් ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම් සහ එම කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන්ද, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, ආයතන අධ්‍යක්ෂ ජනරාල්, ඇතුලු එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සිව් දෙනෙකුගෙන්ද, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ඇතුලු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තිදෙනෙකුගෙන්ද සමන්විත නිලධාරී කමිටුවක සහාය උක්ත අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට ලැබිණ.

05. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව එවකට තිබූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තමන්ට පැවරුනු කාර්ය ඉටු කිරීමේදී සභාපතිවරයා ඇතුළු පූර්ණකාලීන සාමාජිකයන් 09 දෙනෙකුගෙන්ද, ලේකම්, අතිරේක ලේකම්වරුන්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් ඇතුළු මාණ්ඩලික නිලධාරීන් 25 දෙනෙකුගේ හා 125 දෙනෙකුගෙන් පමණ යුත් සෙසු කාර්ය මණ්ඩලයේද සහාය ලැබිණ. **එසේ වුවද, අමාත්‍ය මණ්ඩල කාර්යාලයට මෙකී අතිරේක කාර්යයන් ඉටුකිරීම සඳහා අතිරේක කාර්ය මණ්ඩලයක් නොසිටි බැවින් එම වගකීම ඉටු කරන ලද්දේ එම කාර්යාලයේ වර්තමාන කාර්ය මණ්ඩලය විසින් සතියේ දිනවල කාර්යාල වේලාව ඉක්මවා සහ සති අන්තයේ හා නිවාඩු දිනවල රාජකාරී ඉටුකිරීම මගිනි.**

06. 2009.04.09 දින එවකට පැවති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ධූර කාලය අවසන් වීමෙන් පසුව 2011.05.13 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව අළුතින් පිහිටුවන තෙක්, **එම කොමිෂන් සභාව විසින් ඉටු කළයුතු කාර්යයන් සම්බන්ධයෙන් ලැබුණු ඉල්ලීම් 2418 අතුරින් 2302 සම්බන්ධයෙන් ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය අනුකාරක සභාවේ නිර්දේශය මත අමාත්‍ය මණ්ඩලය විසින් තීරණ ලබා දෙන ලදී.** මෙම කාලය තුළ මීට අතිරේකව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉඳුරාම පැවරී ඇති කාර්යයන් සම්බන්ධයෙන් ලැබුණු ඉල්ලීම් 663 ක් අතුරින් 653 සඳහා තීරණ ලබා දෙන ලදී. (කරුණාකර I වන ඇමුණුම බලනු මැනවි) රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳ කටයුතු අතුරින් අමාත්‍ය මණ්ඩලය වෙත යොමුකර තිබුණු යෝජනාවලින් 116 ක් සම්බන්ධව තීරණ ගැනීමට මෙම කාලය තුළ නොහැකි වුයේ එම යෝජනාවල සංකීර්ණතාව මත වැඩිදුර අධ්‍යයනය කිරීමක් අවශ්‍යවීම, අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් නිකුත් කරන ලද උපදෙස් අනුව අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබීම වැනි හේතු මත වේ.

07. **ආයතන කටයුතුවලට අදාළව එදිනෙදා ඉදිරිපත් වන ඉල්ලීම් සම්බන්ධනේ සුදුසු නිර්දේශ ඉදිරිපත් කරන අතරම රාජ්‍ය සේවයේ විවිධ ක්ෂේත්‍රවලට අදාළ ගැටළු සම්බන්ධයෙන්ද ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය අනුකාරක සභාව විසින් ප්‍රතිපත්තිමය නිර්දේශ රාශියක්ද විටින් විට ඉදිරිපත් කරන ලදී.**

08. **ගතවූ දෙවසරක කාලය තුළදී උක්ත කොමිෂන් සභා විසින් ඉටු කළයුතුව තිබූ කාර්යයන් අමාත්‍ය මණ්ඩලය විසින් කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ ගරු සභාපතිතුමන් ඇතුළු සාමාජික අමාත්‍යතුමන්හට තම වටිනා කාලය කැපකිරීමට සිදුවිය.** ඉහත 04 වන ඡේදයේ සඳහන් නිලධාරීන් ද 5 වන ඡේදයේ සඳහන් මාණ්ඩලික නිලධාරීන්ද කිසිදු අතිරේක පාරිශ්‍රමිකයක් ලබා නොගෙන සාමාන්‍ය රාජකාරී වේලාවෙන් බැහැරව හා රජයේ නිවාඩු දිනවල සේවය කරමින් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට අවශ්‍ය සහාය ලබාදීමෙන් සිය රාජකාරී හා වගකීම් දැඩි කැපවීමකින් යුතුව ඉටු කරන ලද බව විශේෂයෙන් සඳහන් කළයුතු වේ.

09. **ආයතන කටයුතු පිළිබඳව අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ නිර්දේශ මත අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයන්ට එරෙහිව මේ දක්වා කිසිදු පාර්ශවයක් විසින් අධිකරණ ක්‍රියාමාර්ගයකට යොමු නොවීම මගින් මෙම ක්‍රියාදාමය ඉතා සතුටුදායකව ඉටු කරන ලද බව සනාථවී ඇත.**

10. 2011 මැයි 13 දින පිහිටුවනු ලැබූ නව රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2011 මැයි 19 දින සිට ක්‍රියාත්මක වන බැවින්,

(අ) දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පරිදි එම කොමිෂන් සභාව විසින් ඉටු කළයුතු වන කාර්යයන්ට සම්බන්ධ ඉල්ලීම්, සියලු අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් මින් ඉදිරියට එම කොමිෂන් සභාවට යොමු කළ යුතුව ඇත.

(ආ) විවිධ අමාත්‍යාංශ විසින් අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරනු ලැබ, මේ වනවිට අවශ්‍ය තීරණවලට එළඹ නොමැති ඉල්ලීම් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග කටයුතු කිරීම සඳහා එම ඉල්ලීම් අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත යොමු කෙරෙනු ඇත.

ඉහත සඳහන් තොරතුරු අමාත්‍ය මණ්ඩලයේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011.05.31

*(ඇමුණුම 1)*

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් ඉටුකිරීම සඳහා සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල කාලය අහෝසිවීම මත අමාත්‍ය මණ්ඩලය විසින් ඉටු කිරීම සඳහා ලැබුණු යෝජනා පිළිබඳ විශ්ලේෂණය**

| කාලපරිච්ඡේදය | පැවැත්වුණු අනුකාරක සභා රැස්වීම් සංඛ්‍යාව | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් ඉටුකිරීම සඳහා ලැබුණු යෝජනා සංඛ්‍යාව | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් තීරණ ගන්නා ලද යෝජනා සංඛ්‍යාව | රා.සේ.කො. නිල කාලය අහෝසිවීම මත අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද යෝජනා සංඛ්‍යාව | රා.සේ.කො. නිල කාලය අහෝසිවීම මත අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද යෝජනා අතුරින් තීරණ ගන්නා ලද සංඛ්‍යාව | 2011.05.13 දිනට ඉතිරි යෝජනා සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | අමාත්‍ය මණ්ඩලයට අදාළ | රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාළ |
| 2009.05.13 සිට 2009.12.31 | 30 | 325 | 325 | 658 | 658 | - | - |
| 2010.01.01 සිට 2010.12.31 | 34 | 206 | 204 | 1,182 | 1,141 | 02 | 41 |
| 2011.01.01 සිට 2011.05.13 | 15 | 132 | 124 | 578 | 503 | 08 | 75 |
| **එකතුව** | 79 | 663 | 653 | 2,418 | 2,302 | 10 | 116 |